# මවගේ පෙරැත්තය නිසා ගායන ලොවට පිවිසි
# මොහිදීන් ඉෂාක් බෙග්





**ගායක පියාණන්**
**අසහාය සංගීතඥ බෙග් මාස්ටර්**

**ත**ම පවුලේ වැඩිමහල් පුත්‍රයා දක්ෂ මළල ක්‍රීඩකයෙකු කරවීමටයි ඔහුගේ පියාගේ ආශාව වූයේ. පුත්‍රයාගේ අභිප්‍රාය වූයේ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වී ශ්‍රීලංකා පිළ නියෝජනය කිරීමටය. එකිනෙකාගේ සිත් තුළ පළපැදියම්ව තිබුණු මේ ආශාවන් එකක්වත් ඒ ආකාරයෙන් සිදුවූයේ නැත. එහෙත් අද ඔහු අප දිවයිනේ අතිශය ජනප්‍රිය තරුණ ගායකයෙකු ලෙස නමක් දිනා ගෙන සිටී.

ජනප්‍රිය චිත්‍රපට පසුබිම් ගායක, කලකට පෙර අප අතරින් සදහටම වියෝවූ අල්හාජ් මොහිදීන් බෙග් මාස්ටර්ගේ වැඩිමහල් පුත්‍ර මොහිදීන් ඉෂාක් බෙග් ගායකයෙකු ලෙස සංගීත ලොවට අවතීර්ණ වූ ආකාරය ඔහු සමග මේ නොබෝදා ලන්ඩනයේදී කරන ලද සාකච්ඡාවකින් මෙසේ සටහන් කරමි.

1991 වර්ෂයේ දිනෙක පැරණි සිංහල චිත්‍රපට ගණනකම ගීත රචනා කළ ඩී. ටී. ප්‍රනාන්දු නම් කලාකරුවා මොහිදීන් බෙග් මාස්ටර් හමුවීමට පැමිණ ඇත්තේ තමා සිංහල සිනමාවට කළ සේවය අගැයීම සඳහා පැවැත්වෙන ඩී. ටී. ප්‍රනාන්දු උපහාර උළෙල සඳහා තමා විසින් රචනා කරන ලද ගී කීපයක් බෙග් මාස්ටර් ලවා ගායනා කරවීමට ආරාධනා කිරීමටය. (ඩී. ටී. ප්‍රනාන්දු මහතා මෑතකදී අප අතරින් වියෝවූ ලන්ඩනයේ වාසය කළ ලංකා බණ්ඩාර මහත්මියගේ ආදරණීය පියාණන් බව මෙහිදී සිහිපත් කළ යුතුය.) මෙම මුණගැසීම සෑහෙන කාලයකට පසු සිදුවූවක් මෙන්ම එය මාස්ටර්ලා දෙදෙනාටම පැරණි අසෝ කමාලා චිත්‍රපටයේ සිටම අතීත මතක සටහන් දිග හැරීමට කදිම අවස්ථාවක් වීය. ඉහතින් සඳහන් කරන ලද උපහාර උළෙලේදී ඉදිරිපත් කරන ගීත මොනවාද කියා තීන්දු කරගෙන නැවත උත්සවයේදී හමුවන නියායෙන් දෙදෙන සමුගත්හ. මෙම හමුවීමෙන් දින කීපයකට පසු කරන ලද අක්ෂි ශල්‍යකර්මයකට පසු මොහිදීන් බෙග් නම් කලාකරුවණෝ මුළුමහත් ලංකාවම කම්පාවට පත්කරමින් නැවත ප්‍රකෘති සිහිය නොලබා ම සදහටම නෙත් පියාගත්හ.

බෙග් මාස්ටර්ගේ මරණ කටයුතුවලින් සති දෙකකට පමණ පසු ඩී. ටී. ප්‍රනාන්දු මහතා නැවත බෙග් මාස්ටර්ගේ නිවසට පැමිණියේය. ඔහු එදා පැමිණියේ තමන් විසින් රචනා කරන ලද මොහිදීන් බෙග් විසින් ගයන ලද එක් ගීයක් හෝ තරුණ ඉෂාක් බෙග් ලවා ඉදිරිපත් කිරීමට ඇරැයුම් කිරීමටය. පියාගේ අභාවය දක්වාම ගායනා ශිල්පය ගැන කිසිදු අවබෝධයක් හෝ පළපුරුද්දක් තමාට නැති බැවින් එම ඉල්ලීම ඉටු කළ නොහැකි බව ඉශාක් බෙග් අකමැත්තෙන් වුවද ප්‍රකාශකර ඇත. තමා බලාපොරොත්තු වූ පරිදි මොහිදීන් බෙග් ගැයූ එක ගීතයක් හෝ ඉදිරිපත් කරගත නොහැකි නම් උපහාර උලෙල පවත්වන්නේ නැති බව ඩී. ටී. ප්‍රනාන්දු මහතා තරයේ කියා ඇත.

කෙසේ නමුත් එම සංවාදයට සවන් දෙමින් සිටි ඉෂාක්ගේ මව එතැනට පැමිණ කෙසේ හෝ ප්‍රනාන්දු මහතාගේ ඉල්ලීම ඉටුකරන්නට උත්සාහ ගන්නා මෙන් පුත්‍රයාට පෙරැත්ත කළාය. තම මවගේ ඉල්ලීම අහක දැමීමට ඇති අපහසුව සහ මව කෙරෙහි වූ භක්තිය නිසාම එම භාරදූර කර්තව්‍ය ඉටුකිරීමට තමා සිතා ගත්තේ කිසිදු කැමැත්තකින් නොවන බව ඉෂාක් පවසයි.

කෙසේ නමුත් තම බාල සොහොයුරා සහ නැගණිය සමග දින කිහිපයක් තුළදී ගීත කීපයක් පුහුණු වී නියමිත දිනයේ දී ඇල්පින්ස්ටන් රඟහල වෙත ඉෂාක් පැමිණියේය. එහි රැස්ව සිටි ප්‍රේක්ෂක සමූහයා දැක ඔහුගේ බිය දෙගුණ තෙගුණ විය. ඒ මදිවාට එම උළෙලේ ගී ගැයීමට පැමිණ සිටි අනෙකුත් ගායක ගායිකාවන් දුටුවිට ඔහුට වූ චකිතය තීව්‍ර විය. තමාට ගී ගයන්නට සිදුව ඇත්තේ සිංහළ ගීත ලෝකයේ ප්‍රවීන පතාක යෝධයින් සමග බව ඔහුට වැටහිණ. එහෙත් එදා ඒ වේදිකාවේ තමා සිතේ දෙගිඩියාවෙන් පසුවෙද්දී ඒ සැම ප්‍රවීන ගායන ශිල්පියෙකුගෙන්ම ලත් දිරිගැන්වීම ද, උපදෙස් ද තමා අදත් සිහිකරන්නේ අතිශය කෘතඥතා පූර්වකව බව ඉෂාක් පැවසී ය.

තමාගේ වාරය පැමිණි කල **ජීවිත සටන** චිත්‍රපටයේ මොහිදීන් බෙග් ගැයූ **අනේකා ජාතී සංසාරේ** ඇතුළු තවත් ගීත කිහිපයක් ඉෂාක් ඉදිරිපත් කළේය. ගායනය අවසානයේ ලද ඉමහත් ශ්‍රාවක ප්‍රතිචාරයෙන් එදා ඔහුට ප්‍රත්‍යක්ෂ වූයේ තමාගේ කාර්යය සිතුවාටත් වඩා හොඳින් ඉෂ්ට වී ඇති බවයි. උත්සවය අවසානයේ තමා ඉදිරියට පැමිණි නන්දා මාලිනී ඔහුට සුබ පැතුවේ "මේ තාත්ත තියලා ගිහින් තියෙන්නෙ එයාගෙ කටහඩ " යනුවෙනි. ප්‍රමෝදයට පත් ඩී. ටී. ප්‍රනාන්දු මහතා ඉෂාක් වෙතට පැමිණ ඔහුගේ හිසට අත තබා ශුභ අනාගතයකට ආශීර්වාද කළේය. ඉෂාක් බෙග්ට ගායන ලෝකයේ දොරටුව විවෘත වුණේ ඒ නොසිතූ විරූ අයුරිනි.

ඉන් පසුව ඉෂාක්ට කොළඹ ශ්‍රීමාලි එන්ටර්ප්‍රයිස් සමාගමෙන් ගීත කීපයක් පටිගතකිරීමට ඉල්ලුමක් ලැබුණි. ඒ අනුව ඔහුගේ පළමුවැනි ගීත එකතුව වූයේ ස්ටැන්ලි පීරිස් සංගීතවත් කළ **පිය සෙනෙහස** නම් කැසට් පටයයි. අනතුරුව තම පියා ගැයූ ගීත ගණනාවක් ඔහු කැසට් හා සීඩී තැටිවලට නැගීය. චිත්‍රපට හා ටෙලි නාට්‍ය සඳහාද ගී ගයා ඇති ඔහු එක් සිංහළ චිත්‍රපටයක සුළු දර්ශනයකට ද පෙනී සිටි බව පැවසීය.

දැනට ඔහු විසින් සකස්කරගෙන යනු ලබන **CD** තැටියකට නැසීගිය කරුණාරත්න අබේසේකර සහ ප්‍රේමකීර්ති ද අල්විස් රචනා කළ ගීත දෙකක්ද අඩංගුවෙනවා ඇත.

මොහිදීන් ඉෂාක් බෙග් අධ්‍යාපනය හැදෑරුයේ කොළඹ මරදානේ සහිරා විද්‍යාලයෙනි. අධ්‍යාපන පොදු සහතික උසස් පෙළ සමත් වුවත් පියාගේ අභාවය නිසා වැඩිදුර අධ්‍යාපනය අත්හැර දැමීමට සිදුවීම ගැන ඔහු කණගාටු වෙයි. සහිරා විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමට වේග පන්දු යවන්නෙකු ලෙස ක්‍රීඩා කළ ඉෂාක්, පසුව කොළඹ **SSC** ක්‍රීඩා සමාජ පිළට අර්ජුණ රණතුංග, අරවින්ද සිල්වා සහ හෂාන් තිලකරත්න සමග ක්‍රීඩාකර තිබේ. තම පියාගේ අභාවය නිසා සංගීතය වෘත්තියක් කර නොගත්තේනම් තමා ශ්‍රීලංකා ක්‍රිකට් පිළට ඇතුළුවී ශ්‍රීලංකාව නියෝජනය කරන්නට තිබූ අවස්ථාව ඇත නොවූ බව ඉෂාක්ගේ අදහසයි.

ඕස්ට්‍රේලියාව, මැදපෙරදිග, කැනඩාව, ඇමරිකාව හා එක්සත් රාජධානියේ පැවති සංගීත ප්‍රසංග වලට සහභාගිවී ඇති ඉෂාක් වඩාත් ජනප්‍රියව සිටින්නේ තරුණ ශ්‍රාවකයින් අතර බව මගේ හැඟීමයි. ඒ බව මෑතකදී ලන්ඩනයේ **O2** රඟහලේදී පැවති ගී තරු සංදර්ශනයේදී මොනවට පැහැදිලි විය. පසුගිය දා ඔහු මෙහි පැමිණියේ හයවන වතාවටය.

ඉෂාක් ස්වභාවයෙන්ම අතිශය නිහතමානී එමෙන්ම ලජ්ජාශීලී පුද්ගලයෙකු බව මගේ හැඟීමයි. පියාට වඩා සිංහළ උච්චාරණයෙහි ඇති සමත්කම නිසා ඔහුගේ ගායනා විලාශයේ අමුතුම මටසිළුටු බවක් දැවටී ඇත. ඔහුට සිංහල කතාකිරීම ලිවීම හා කියවීමට එකසේ හැකියාව ඇත.

වයස අවුරුදු 45 ක් වන ඉෂාක් දරු තිදෙනෙකුගේ පියෙකි. තමාගේ දරුවන් ඉගෙනීමට දක්ෂ නිසා ඔහු වෑයම් කරන්නේ දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබාදෙන්නටය.

ඉෂාක් ශ්‍රීලංකාව අතහැර විදේශයේ පදිංචියට යන බවක් මෑතකදී අපට අසන්නට ලැබිණ. ඔහු තුළ දැඩිව එවැනි අදහසක් තවම නැතත් ඔහු එම අදහස සම්පූර්ණයෙන් ම අත්හැර දමාද නැත. ලංකාව අතහැර යනවාදැයි මා ඔහුගෙන් ඇසූ විට ඔහුගේ පිළිතුර වූයේ " කව්ද අකමැති ස්ථාවර ජීවිතයක් ගෙනියන්න ? " යනුවෙනි.

බෙග්මාස්ටර් අපේ සිංහළ ගීතයට සංගීතයට අනූපම සේවයක් කළා මෙන්ම ඔහුගේ මේ ඉෂාක් පුතණුවන්ද ඒ මගෙහිම යමින් අප රටේ සිංහළ ශ්‍රාවක සමූහයාගේ සිත් සතන් බොහෝ කාලයක් ඔකඳකරනවා ඇත. ඔහුගේ ගැඹුරු හඬ පිය උරුමයක සැබෑ රිද්මය සහ මහිමය කොතෙක්දැයි අපට පසක් කරවයි.

**සටහන සහ ඡායාරූප**
**♦ විල්ෆ්‍රඩ් පෙරේරා**
**Berks UK**



ඉෂාක් ශාස්ත්‍රීය ගීතයක් ගයා පෙන්වයි

## ආදරයෙන් සිහිකිරීමයි!

## චරිත් ජයවර්ධන

### කවදද පුතේ යළි ඔබ අප වෙත එන්නේ ?

චරිත් පුතා අපගෙන් සමුගත් දිනය
සිරිත් පරිදි තුන් වසරකි දුකෙන් ගිය
ඔබත් සමග ඇසුරේදි ලත් හද පිරිය
මතක් වෙන්නෙ දුක් පිරි නෙත් කඳු ලෙනිය

ඉ තා කුඩා වයසේදි ඔබ පැව දහේ
සි තා කියන්නේ හද නැගි දුකෙනි මගේ
ල තා වකට ගැයූ රම්පොට ගීය රහේ
කතා කරනු කෙලෙසද දිව ගොතයි වගේ

අම්මගෙ සුරතලා තුරුළේ සිටිය ඔබ
තාත්ත විහිළුවෙන් කුල්මත් කළේ ඔබ
අයියගෙ තනිය මැකුවේ දහ පොරෙන් ඔබ
මේ හැම දුක්වෙනව නිතරම නැතුව ඔබ

සොයුරෙක් වගේ මිතුරන් ඔබ ඇසුරු කළ
හැමකෙක් හිතුවෙ උන්ගේ එකෙකැයි නිමල
හේතුව එයයි සංචාරෙට කතා කළ
මරුවා තමයි අප හට එය වසන් කළ

අම්මා තාත්තා අයියා අප සැමද
නිති ඔබ අපේ හදවත් තුළ තදින් බැඳ
තෙත් වූ දෙනෙත් වියලෙන්නට ඉඩ නොලද
කවදා නැවත සසරේදි අප එක් වේද?

මෙයට සොවින් තැවෙන
ලොකු තාත්තා

**♦ වින්සන්ට් ජයවර්ධන**
**හිටපු ගාළු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී**



**මීට වසර තුනකට පෙර ර්පීප්තුවේදී ත්‍රස්තවාදී බෝම්බයකින් මියගිය 17 වියේ පසුවූ චරිත් ජයවර්ධන තරුණ පුත්‍රයා සිහිකිරීම පිණිස ගාලු දිස්ත්‍රික්කයේ හිටපු මන්ත්‍රී වින්සන්ට් ජයවර්ධන මහතා විසින් මේ කවි පෙළ ලියා එවා ඇත.**

**එංගලන්තයේ ග්‍රැන්තම්හි වෙසෙන චරිත්ගේ අම්මා, තාත්තා, අයියා සහ ලන්ඩනයේ පර්මා ඉන්ටර්නැෂනල් හි පර්සි ජයවර්ධන ලොකු තාත්තාද මේ මියගිය පුතා ආදරයෙන් සිහිකරති.**

## Fake pilot takes SriLankan Airlines for a ride

Civil Aviation authorities yesterday revoked the licence of a SriLankan Airlines flight captain after it was revealed that the man was a fake, a top official said. Civil Aviation Director General Parakrama Dissanayake said the pilot, a German national, had gained employment with the airlines, producing cleverly-doctored documents.

He said the decision to revoke the licence was taken after Sri Lankan Airline submitted clear evidence which suggested that the suspect had forged documents regarding his qualifications and experience.Mr. Dissanayake said the man was later summoned to the Civil Aviation Authority office for an inquiry conducted by senior flight officers. It was thereafter decided to revoke the license with immediate effect.

The German national joined the national carrier in 2007 and had piloted flights to various capitals, risking the lives of thousands of passengers and crew as well as many others on the ground, SriLankan Airlines sources said. They said the suspect had not only possessed a forged pilot license but also carried three different passports.

It has now been revealed that the man was not a qualified airline captain but a low